අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. ED /9/9/1/66 ඔබේ යොමුව / உமது இல. / Your Ref. දිනය / திகதி / Date 2019.10 29.

**චක්‍රලේඛ අංකය 42 :/2019**

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,

සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

අධ්‍යාපන කොට්ඨාස භාර නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

ප්‍රාථමික පන්ති පැවැත්වෙන සියලු ම පාසල්වල විදුහල්පතිවරුන් වෙත.

**<u>පස්වන ශ්‍රේණිය සඳහා 2020 වර්ෂයේ සිට නව විෂයමාලාව ක්‍රියාත්මක කිරීම</u>**

1998 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සහ 2007 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාථමික අධ්‍යාපන නවීකරණ තවදුරටත් ශක්තිමත් ව ක්‍රියාත්මක කිරීම අරමුණු කරමින් පස්වන ශ්‍රේණිය සඳහා දැනට භාවිත වන විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ, පෙළපොත් හා වැඩපොත් 2020 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කර ඇත. ඒ අනුව ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ නිකුත් කරන ලද අංක 2008/49 හා 2008.12.05 දිනැති චක්‍රලේඛයේ අංක 1,6,7,8,සහ 10 පහත පරිදි සංශෝධනය කරනු ලබන අතර මෙම චක්‍රලේඛය 2020.01.01 දින සිට බලාත්මක වේ.

I. අංක 1 - 2020 වර්ෂයේ සිට පස්වන ශ්‍රේණිය සඳහා සංශෝධිත විෂයමාලාව ක්‍රියාත්මක කළ යුතු වේ.

II. අංක 6,7 හා 8 - මෙතෙක් භාවිත කළ පස්වන ශ්‍රේණියේ විෂය නිර්දේශ හා ගුරු මාර්ගෝපදේශ වෙනුවට සංශෝධිත නව විෂය නිර්දේශ හා ගුරු මාර්ගෝපදේශ 2020 වර්ෂයේ සිට ක්‍රියාත්මක කළ යුතු ය.

III. අංක 10 - මෙම නව විෂය නිර්දේශ හා ගුරු මාර්ගෝපදේශවලට අනුකූල ව අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කර ඇති පස්වන ශ්‍රේණියේ පෙළපොත් හා වැඩපොත් 2020 වර්ෂයේ සිට ක්‍රියාත්මක කළ යුතු ය.


ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister — +94112784832 / +94112784825 / minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary — +94112784811 / +94112785162 / secretary.education@moe.gov.lk

මීට අමතරව 2008.12.05 දින නිකුත් කරන ලද අංක 2008/49 චක්‍රලේඛයට අංක 12 හා 13 ලෙස පහත පරිදි නව උපදෙස් ඇතුළත් කරනු ලැබේ.

12 .2020 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පස්වන ශ්‍රේණියේ නව විෂය නිර්දේශවලට අදාළ තක්සේරු උපකරණ භාවිත කරමින් සිසු ප්‍රගතිය තක්සේරු කිරීම සිදුකළ යුතු ය. තුන්වන ප්‍රධාන අවධියට අදාළ අත්‍යාවශ්‍ය ඉගෙනුම් නිපුණතා ක්‍රියාත්මක කිරීම තුන්වන ප්‍රධාන අවධියට අලුතෙන් හඳුන්වා දෙන ගුරු මාර්ගෝපදේශයේ ඇතුළත් උපදෙස් අනුව ක්‍රියාත්මක කළ යුතුය.

13. පස්වන ශ්‍රේණියට හඳුන්වා දී ඇති නව විෂය නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ දී සිසුන්ට ගෙදර වැඩ පැවරීම අවම විය යුතු ය. සතියේ දිනවල ගෙදර වැඩ පැවරීම අත්‍යාවශ්‍ය අවස්ථාවක පමණක් ම සිදු කළ යුතු අතර සති අන්තයේ දී ද ගෙදර වැඩ පැවරීම කළ යුතු වන්නේ ඉතා සීමිත ව පමණක් බව අවධාරණය කරමි.

එම්. එන්.රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :-

1. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය - කරු. දැ.ගැ.ස.
2. කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව - කරු. දැ.ගැ.ස.
3. කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව - කරු. දැ.ගැ.ස.